දුරකථන : 0112669192 , 0112675011
தொலைபேசி : 0112698507 , 0112694033
Telephone : 0112675449 , 0112675280

ෆැක්ස් : 0112693866
பெக்ஸ் : 0112693869
Fax :0112692913

විද්‍යුත් තැපෑල :postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி :
e-mail :

වෙබ් අඩවිය : www.health.gov.lk
இணையத்தளம் :
website :

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය : NA/08/Principal/2023
எனது இல :
My No. :

ඔබේ අංකය :
உமது இல :
Your No. :

දිනය : 2023.05. 25
திகதி :
Date :

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක :- **02-72/2023**

අදාළ ආයතන ප්‍රධානීන් සහ,
සියලුම හෙද විද්‍යාලපති / විද්‍යාලපතිනියන් වෙත.

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද විද්‍යාලපති තනතුර සඳහා බඳවා ගැනීම.</u>**

පහත සඳහන් හෙද විද්‍යාලවල පුරප්පාඩුව පවතින විද්‍යාලපති තනතුරු සඳහා විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** හෙද විද්‍යාල - යාපනය
**02.** හෙද විද්‍යාල - කුරුණෑගල

02. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති හෙද සේවයේ නිලධාරීන්ට/නිලධාරිනියන්ට මේ සඳහා අයදුම් කළ හැකි ය. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතාව පදනම් කරගෙන එම තනතුරු සඳහා පත් කිරීම සිදු කරනු ලැබේ. කුසලතාව අනුව තමන් පත් කරන සේවා ස්ථානයේ සේවය සඳහා වාර්තා කරනු නොලැබුවහොත්, පත්වීම අවලංගු වනු ඇත. එමෙන්ම දැනට හෙද විද්‍යාලපති තනතුරු දරන නිලධාරීන්ට ද ඉහත විද්‍යාලවල හෙද විද්‍යාලපති තනතුරට පත්වීමක් අවශ්‍ය වන්නේ නම්, මේ අනුව අයදුම් කළ යුතු වේ. එමෙන්ම පුරප්පාඩුව පවතින හෙද විද්‍යාලවලට සුදුසුකම්ලත් නිලධාරියෙකු තෝරා පත් කිරීමේ දී ඒ වන විට විද්‍යාලපති තනතුරක් දරන අයදුම්කරුවකු/අයදුම්කාරියක තේරී පත් වුවහොත්, එම පුරප්පාඩු වන හෙද විද්‍යාලපති තනතුර ද මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කිරීමට නියමිත ය.

**2.1 සුදුසුකම්**

2.1.1 විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) නිලධාරියෙකු වීම.

2.1.2 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

2.1.3 පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.1.4 අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 05 ක් තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**03. අයදුම්පත් එවීමේ ක්‍රමය**

3.1 මෙම චක්‍රලේඛ මගින් දක්වා ඇති ආදර්ශය අනුසාරයෙන් අයදුම්කරුවන් විසින් පිළියෙල කරනු ලබන අයදුම්පත් **2023.06.21** දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ අදාළ හෙද විද්‍යාලපති වෙත ඉදිරිපත් කළ යුතු ය. අදාළ හෙද විද්‍යාලපතිවරුන්ට ලැබෙන අයදුම්පත්වල නියමිත ස්ථානයේ සිය නිර්දේශයන් සඳහන් කර, අදාළ මහ රෝහලේ අධ්‍යක්ෂවරුන්ට/සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාලන) 05 වෙත **2023.06.30** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය.

3.2 මහ රෝහල් අධ්‍යක්ෂවරුන්/අධ්‍යක්ෂ (පාලන) 05 විසින් අයදුම්පත්වල තිබෙන කරුණු අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපිගොනුවල වාර්තා සමඟ සසඳා බලා, එහි සඳහන් විස්තරවල නිරවද්‍යතාවය ගැන සහතික කළ යුතු ය.

3.3 අයදුම්පත්වල අවසානයේ සඳහන් වාර්තාව ද සමඟ සම්පූර්ණ කරන ලද අයදුම්පත් ශික්ෂණ රෝහල්/මහ රෝහල් අධ්‍යක්ෂවරුන්/අධ්‍යක්ෂ (පාලන) 05 විසින් **2023.06.30** දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කළ යුතු ය. කිසිඳු හේතුවක් නිසාවත් නිලධරයෙකු විසින් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ රහිතව හෝ ආවරණ ලිපියක් රහිතව ඉදිරිපත් කරන අයදුම්පත් භාරගනු නොලැබේ. මෙම නිවේදනයට පරිබාහිර සෑම අයදුම්පතක්ම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පත් යොමු කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ "සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද විදුහල්පති තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු වේ.

## 04. තෝරා ගනු ලබන ක්‍රමය

4.1. සුදුසුකම් සහිත අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

4.2. තනතුරට බඳවා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 2 හි සුදුසුකම් **2023.06.21** දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

4.3. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

4.4. සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ කරගන්නා ලකුණු පටිපාටිය පහත දැක්වේ.

4.4.1. විශේෂ ශ්‍රේණියේ සේවා කාලය (ලකුණු 50)
(එක් වර්ෂයකට ලකුණු 05 බැගින් හිමිවන අතර මාස 03ක් සඳහා අනුපාතිකව ලකුණු 1.25 ක් හිමි වේ.)

4.4.2. හෙද විදුහල්පති තනතුරේ පළපුරුද්ද සඳහා (ලකුණු 20)
(එක් වර්ෂයකට ලකුණු 02 බැගින් හිමිවන අතර මාස 03ක් සඳහා අනුපාතිකව ලකුණු 0.5 ක් හිමි වේ.)

4.4.3. විශේෂ කුසලතාවයන් සඳහා (ලකුණු 10)
(එක් කුසලතාවයකට ලකුණු 2.5 බැගින්)

i. ව්‍යාපෘතියක් සඳහා (ලකුණු 2.5)
ii. ප්‍රකාශනයක් සඳහා (ලකුණු 2.5)
iii. විශේෂ පුහුණු පාඨමාලාවක් සඳහා (ලකුණු 2.5)
(කාලය මාස 06කට නොඅඩු පුහුණු පාඨමාලා පමණක් සලකා බලනු ලැබේ.)
iv. අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණයක් සඳහා (ලකුණු 2.5)

4.4.4. වෘත්තීය සුදුසුකම් (ලකුණු 15)
(ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

I. ක්ෂේත්‍රයට අදාළ මාස 06 කට වැඩි අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (ලකුණු 10)
II. හෙද විද්‍යා උපාධිය සඳහා (ලකුණු 15)

4.4.5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය සඳහා (ලකුණු 05)

05. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

06. තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව හා අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අමප 10/1798/415/101 හා 2010.08.31 දිනැති ලිපිය මගින් දක්වා ඇති 2010.08.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව MT-08-2016 හි 04 වන වැටුප් පියවරෙන් ඇරඹෙන වැටුප් පරිමාණයේ අනුරූපී වැටුප් පියවර, විදුහල්පති දීමනාව හා ඉගැන්වීමේ දීමනාව හිමි වේ.

07. මෙම චක්‍රලේඛයේ අඩංගු සියලු කරුණු සුදුසුකම් ලබා ඇති හෙද සේවයේ සියලුම නිලධාරීන්ට/නිලධාරිනියන්ට දැන ගැනීමට සැලැස්වීම අදාළ ආයතන ප්‍රධානියාගේ වගකීමක් වනු ඇත.

08. මෙම චක්‍රලේඛයේ සිංහල, ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

09. තවද මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි

ගීතාමණී සී. කරුණාරත්න
ලේකම් (වැ.බ.)
සෞඛ්‍ය අමාත්‍යාංශය.

වැඩ බලන ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත :- ලේකම් , රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව - දැ.ගැ.පි